# සර්වෝදය සිය පශ්චාත් සුනාමි සයමාසික කාර්ය වාර්තාව ප්‍රකාශයට පත් කරයි.

## දයානුකම්පාවේ රළ පෙළ විනාශයේ උදම් රළ අභිබවයි

ලෝක ජනාවාස දිනය සනිටුහන් කිරිම සඳහා ඉන්දුනිසියාවේ ජකර්තා නුවරදී 2005 ඔක්තෝම්බර් මස 03 වැනි දින පවත්වනු ලැබූ විශේෂ උත්සවයකදී එක්සත් ජාතීන් විසින් සිය අතිශය සම්මානනීය ජනාවාස පිලිබඳ ගෞරව සම්මාන සන්නස් පත්‍රය පිලිගැන්වූ අවස්ථාවට සමගාමීව, 2004 දෙසැම්බර් මස සිදුවූ සුනාමි ඛේදවාචකයෙන් පසු විපතට පත් ජීවිත යලි නගා සිටුවීමට සර්වෝදය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගයන් පිලිබඳ වාර්තාවක් නිකුත් කර ඇත.

පලමු රළ පහර වැදී පැය කීපයක් ඉක්මයාමටත් පෙර සිට මේ දක්වා ගතවූ කාලය තුල සර්වෝදය මගින් ක්‍රියාත්මක පශ්චාත් සුනාමි කටයුතු ගම් නියම් ගම් 226 ක් වන පරාසයක පැතිර ඇති අතර , වර්ෂ 2008 වන විට ප්‍රතිලාභි ගම්මාන 1000 ක් දක්වා ඉලක්ක කර ගෙන වැඩ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. මේ උදෙසා තවමත් පරිත්‍යාග ලැබෙමින් පවතින අතර ආයතන මට්ටමෙන් හා පෞද්ගලික පරිත්‍යාගශිලීන්ගෙන් මේ දක්වා රුපියල් මිලියන 397 ක ( ඇ. ඩො. මිලියන 3.97) පරිත්‍යාග සර්වෝදය සංගමය වෙත ලැබී ඇත. මෙම පරිත්‍යාග දැනටද ඉදිරියේදීද , සර්වෝදයේ 5 ආර් **(5R)** යන කෙටි නාමයෙන් හැඳින්වෙන ප්‍රතිපත්තිමය වැඩ සටහනට සහන, පුනරුත්ථාපන , ප්‍රතිසංස්කරණ ,සමථකරණ හා යලි උදාකිරීම ( Relief , Rehabilitation , Reconstruction , Reconciliation and Reawakening) - " සුනාමියෙන් දේශෝදයට" නමින් වන වැඩ සටහනට අනුකූලව වැය කරනු ඇත.

"අපගේ සහෝදර සේවකයින්ගේ ද ගේ දොර හිත මිත්‍රාදීන් පවුලේ ඥාතීන් බිලිගත් මේ මහා ඛේදවාචකයේදී අපගේ මුළු මහත් කාර්යය මණ්ඩලය ගම්වාසීන් හා අන්තර්ජාතික ස්වේච්ඡා සේවකයින් සියළු දෙනාම එකා මෙන් එකට එකතු වී කිසිම පැකිලීමකින් තොරව තමන්ගේ සගයන් ඇතුළු විපතට පත් ජනතාවට Ëණික සහන සැලසීමේ කටයුතුවල දිවා රාත්‍රි නිරත වූහ. ඔවුන් පරාර්ථකාමී හා ත්‍යාගශීලි කැපකිරීම් සර්වෝදය භාවාර්ථයන්ට අනුව සාමාන්‍ය ක්‍රියාදාමයන් වන නමුත් මහා ව්‍යසනයක් සිදුව මිනිසුන් ඉමහත් ශාරීරික හා මානසික වේදනාවට පත්වූ අවස්ථාවක මෙතරම් ආත්ම පරිත්‍යාගශීලීත්වයක් දැකීමට ලැබීමෙන් මගේ හදවත අතිශයින් සංවේදනයට පත්විය" , යැයි සර්වෝදය නිර්මාතෘ හා ගරු සභාපති ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතා පැවසිය.

දෙසැම්බර් 26 වැනි දින සිටම සර්වෝදයේ ආරම්භක ප්‍රතිචාරය වූයේ සර්වෝදය මූලස්ථානයේ හා දිස්ත්‍රික්කවලට අනුයුක්ත සියළුම කාර්ය මණ්ඩලය, අතිරේක ස්වේච්ඡා සේවකයින්ද කැටුව ක්ෂණික, අත්‍යවශ්‍ය සහනාධාර බෙදා හැරීමය. පෙබරවාරි 08 වැනි දින වන විට රුපියල් මිලියන 44.6 ක් ( ඇ .ඩො. 450,000 ) වටිනා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ජලය, ඇඳුම් පැලඳුම්, සපත්තු, අධ්‍යාපනික ද්‍රව්‍ය හා මූළුතැන්ගෙයි උපකරණ උතුරු නැගෙනහිර පලාත් ඇතුළු විපතට පත් සියළු ජන කොටස් වෙත බෙදා හැර තිබුණි. නැව් මගින් එවන ලද කන්ටේනර් 48 ක හා ගුවන් මගින් එවන ලද ගුවන් යානා 15 ක සහනාධාර බඩු තොග අන්තර්ජාතික හිතවතුන්ගෙන් හා පරිත්‍යාගශීලීන්ගෙන් සර්වෝදයට ලැබුණි. මින් කන්ටේනර් 36 ක බඩු තොග සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලැබිය.

සර්වෝදය ශාන්ති සේනා සාම සංසදය මගින් පෙබරවාරි මාසයේදී දිවයිනේ විපතට පත් දකුණු හා නැගෙනහිර ප්‍රදේශවල ගම්මාන 113 ක සුභසාධක මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදි. සර්වෝදය සම්ප්‍රදායට අනුකූලව , විපතට පත්නොවූ ගම්මානවල සිටි ශාන්තිසේනා ස්වේච්ඡා සේවකයෝ , විපතට පත්වූ ගම්මාන කරා ගොස් ඒවායෙහි නේවාසිකව සිටිමින් අවශ්‍ය

කටයුතුවල යෙදෙමින් විපතට පත් සහෝදර ජනතාවගේ සිත් සතන් සැනසීමට කටයුතු කළහ. එහා කළ යුතු කාර්‍යයන් වුයේ පවිත්‍රතා කටයුතු සංවිධානය කිරීම , සුවසේවා හා ප්‍රථමාධාර සේවා සැපයීම , ජල පවිත්‍රතාවය හා පෝෂණ ආධාරක සැපයීම වේ.

ක්ෂණික සහනාධාර බෙදා හැරීමේ සේවාවලින් අනතුරුව දැනට කරගෙන යනු ලබන කාර්යයන් දිස්ත්‍රික්ක 12 ක ව්‍යාප්ති කර ගෙන ඇත. එකී කාර්යයන් නම් , කඳවුරු හා ප්‍රජා කළමනාකරණය ,ජලය හා සනීපාරක්‍ෂාව , සෞඛ්‍යය හා නිවාරක කාර්‍යයන් , නිවාස හා යළි පදිංචි කිරීම , කාන්තාවන් , ළමුන් හා අනත් දරුවන් , මානසික හා අධ්‍යාත්මික සුවය සැලසීම , ජීවන මාර්ග ආධාර, නැතිවු නෛතික ලේඛණ සැකසීමේ හා නෛතික සහය, පරිසර කළමනාකරණය හා පරිසර විද්‍යාව , සන්නිවේදනය හා ආපදා කළමනාකරණය හා අවම කිරීම, ඒකාබද්ධ ගම්මාන සංවර්ධනය (Integrated Villages).

සැමවිටම, සර්වෝදයේ ප්‍රධාන අභිප්‍රාය වුයේ ශ්‍රී ලාංකික ජනතාව සමග පූර්ණ සංහිඳියාවෙන් කටයුතු කිරීම සහ විනිවිදිභාවය හා වගකීම භාරගැනීමේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් ඒ ඒ කාර්යයන් ඵලදායි ලෙසත් , තිරසාර හා කාර්‍යක්ෂම ලෙසත් ඉටුකිරීම වේ.

දේශෝදය යළි උදා කොට රට පෙරට ගෙන යාම සඳහා සියළුම ප්‍රජාවන්ට පිළිගත හැකි ප්‍රතිපත්ති මාලාවක් හා වැඩ සටහනක් සකස් කිරීම සඳහා වෘත්තිය හා විද්වත් ශ්‍රී ලාංකිකයින් 95 දෙනෙකුගෙන් සමන්විත දේශය යළිඋදාකිරීමේ මණ්ඩලයක් පිහිටුවා ඇත. අරමුදල් පරිහරණය හා ගිණුම්කරණය සම්බන්ධ වගකීම් පැවරුණු කමිටුව හිටපු මහ බැංකු අධිපතිතුමාගේ උපදේශකත්වයෙන් ක්‍රියාත්මක වේ. ජනාධිපති ලේකම් කාර්‍යාලයේ සියළුම අංශ , රජය , පරිත්‍යාගශිලි ප්‍රජා කණ්ඩායම් සහ ටැෆ්රන් (TAFREN) සංවිධානය ( ජාතිය යළි ගොඩනැගීමේ කාර්‍ය සාධක මණ්ඩලය) සමග සමීප සම්බන්ධතාවයෙන් සර්වෝදය අඛණ්ඩව කටයුතු කරගෙන යයි. දරිද්‍රතාවයට යළි හිස එසවීමට ඉඩ නොතබන ලෙසත් , කල්තියා අනතුරු හැඟවීමේ ක්‍රමයක් සහිතව ශ්‍රී ලංකාවේ සෑම පලාතකම යළි පදිංචි කිරීම වේගවත් කරන ලෙසත් සර්වෝදය සියළු පාර්ශවයන්ගෙන් උදක් ඉල්ලා සිටී.

සර්වෝදය දායකත්වයේ අංගයක් ලෙස මනා පරිපාලනය , පසුවිපරම හා ඇගයීම තහවුරු කිරීම සඳහා පරිත්‍යාගශිලීන් හා සබඳතා පැවැත්වීමේ සවිස්තරාත්මක ක්‍රියාමාර්ගයක් සර්වෝදය විසින් සකස්කර තිබේ.

සහන සේවා පිලිබඳ විස්තර දිනපතා සර්වෝදය වෙබ් අඩවියෙහි යාවත්කාලීනව දක්වන ලද අතර , එය අන්තර්ජාතික පරිත්‍යාග ලැබීමේ ප්‍රධාන මාර්ගයක් බවට ඉක්මනින්ම පත් විය.

දේශිය හා විදේශිය ප්‍රජාවගෙන් සහ සංවිධානයන්ගෙන් ඩොලර් 05 - 10 සිට මිලියන 01 ඉක්මවමින් සර්වෝදයට ලැබුණු අතිවිශාල සහයෝගය නිසාම හදිසි සහන සේවා මෙන්ම දේශය යළි උදාකිරීමේ මෙම කාර්‍යයන් සාර්ථකව සිදුකිරීමට හැකිව ඇති බව කෘතඥ පූර්වකවසඳහන් කළ යුතුය.

# <u>උගත් පාඩම්</u>

සර්වෝදය සිය සය මාසික පශ්චාත් සුනාමි වාර්තාව ප්‍රකාශයට පත් කරයි

2005 ඔක්තෝම්බර් මස 03 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හා ප්‍රබලම සංවර්ධන ආයතනය ලෙස කටයුතු කිරීමේදී ලත් අත්දැකීම් තුළින් ඉගෙන ගත් වැදගත් පාඩම් ගණනාවක් සර්වෝදය විසින් හඳුනා ගෙන ඇත.

පසුගිය හතළිස් හය වසරක කාලයක් මුළුල්ලේ කරන ලද සේවාවන්, විශේෂයෙන් සුනාමි ව්‍යසනයෙන් පසුව ලත් ජයග්‍රහනයන් අගය කිරීම් වස් 2005 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ ජනාවාස පිලිබඳ ගෞරව සම්මාන ප්‍රදාන සන්නස් පත්‍රය අද සර්වෝදය වෙත පිරිනමනු ලබයි.
සර්වෝදයට මුහුණ දීමට සිදුවූ බොහෝ අභියෝග ද, ගැණිය නොහැකි තරම් වෙනත් සංවිධානද තිබුනේ වී නමුත් , ලොව පුරා දක්නට ලැබුණු ආත්ම පරිත්‍යාගශිලීත්වය හා ගලා ආ දයානුකම්පිත හැඟිම් සමුදාය හමුවේ සර්වෝදය ප්‍රමුදිතව හා දිරිමත්ව සිටින අතර පෙර කවර කාලයකවත් සිදුවී නැති මෙවන් මහා ව්‍යසනයේදී දැක්වූ ප්‍රතිචාරය මානව දයාවේ උදාරත්වය පිළිබිඹු කිරීමක් බව සර්වෝදයේ විශ්වාසයයි .

හදිසි අනතුරු ඇඟවීමේ විධි පද්ධතියක් හෝ නැගෙනහිර දෙස සිට ජල රළ පැතිර යන අවස්ථාව සන්නිවේදනය කිරීමට අන්තර්ජාතික සහ ජාතික පණිවුඩ හුවමාරු ජාලයක් නොතිබීම අති විශාල ජීවිත සංඛ්‍යාවක් විනාශ වීමට හේතුවූ ප්‍රධාන සාධකයයි. භූ චලනයෙන් විනාඩි 30 කට පසුව එනම් උදේ 8.30 – 10.30 අතර කාලය තුල සුනාමියෙන් ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරයට පහර වැදින. පුළුල් උපදේශක සාකච්ඡාවකින් අනතුරුව ජාතිය යළි ගොඩ නැගීමේ කාර්යය සාධක බලකාය (TAFREN) වෙත හා ජනාධිපති තේරීම් කාරක සභාව වෙත අදහස් මාලාවක් ඉදිරිපත් කල වැන්ගාඩ් පදනමේ මුලිකත්වය දැරූ විශේෂඥ කණ්ඩායමට සර්වෝදයද අයත් විය. එයට www.lirneasia.net/ national - early – System/. වෙබ්අඩවිය හරහා ප්‍රවේශ විය හැක.

තමන්ගේම සන්නිවේදන හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන කිරීමට හා ආපදා කළමනානරණ ආයතනයක් පිහිටුවීමෙන් ස්වාභාවික හෝ මිනිසා විසින් ම නිර්මාණය කල ආපදාවල හානි හා ප්‍රතිවිපාක අවම කර තත්වය යථා ස්වභාවයට පත්කිරීමේ වැඩ පිලිවෙලක් සංවර්ධනය කිරීමටද සර්වෝදය බලාපොරොත්තුව සිටී.

ගම්වාසීන්ට තමන්ගේම තීරණ ගත හැකි ප්‍රාදේශිය මට්ටමෙන් ඒ තීරණ ක්‍රියාවට නැංවීමට ක්‍රියාත්මක විය හැකි ඒකකයක් ලෙස ගම බලවත් කිරීමේ ග්‍රාම ස්වරාජ්‍ය සැලසුම ප්‍රචලිත කිරීම සඳහා ආධාර කිරීමටත් පෙරටත් වඩා දැන් සර්වෝදය අධිෂ්ඨානශිලීව සිටී. ආපදා අවස්ථාවලදී මැඩ පැවැත්වීමට සිදුවූ, නිශ්චල රෙගුලාසි හා නිලධාරීවාදය ධෛර්යය හිනකරවන සුළු විය.

පරිත්‍යාගවල අධිකභාවය තුලින්ම අභියෝග නිර්මාණය වී තිබේ. ව්‍යාපෘති කළමනාකරණය කළ යුතු වුවාක් මෙන්ම ක්‍රියාත්මක කිරීමද කල යුතු විය. පරිත්‍යාග අරමුදල්වල හා පරිත්‍යාගශිලීන්ගේ අපේක්ෂාවන්හි භාරකාර හා ක්‍රියාකාරී ආයතනය ලෙස සිය කාර්ය භාරය ඉතා මැනවින් ඉටු කිරීමේ බරපතල වගකීම සර්වෝදය විසින් ඉතා උපේක්ෂාවෙන් යුතුව භාරගනු ලැබ ඇත.සර්වෝදයේ කලමනාකරණය , තොරතුරු තාක්ෂණය , කාර්ය මණ්ඩලය ,සංවිධානය හා ව්‍යුහය මත පැවරී ඇති බරපතල කාර්ය භාරය අවහක්සේරු නොවිය යුතු අතර , කාර්යක්ෂමභාවය හා ඵලදැයිතාවය වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ ප්‍රධාන පිරිස් සමූහයක් ආපදා කළමනාකරණ ව්‍යාපෘති වැඩ මුළුවලට සහභාගි වෙමින් සිටිති.

# සර්වෝදය ශ්‍රමදාන වල පසුබිම

"සියල්ලන්ගේම උන්නතිය සඳහා කාලය , අදහස් හා ශක්තිය බෙදා හදා ගැනීම."

## හැඳින්වීම

1958 වර්ෂයේදී අචාර්ය ඒ .ටී. ආරියරත්නයන් විසින් ආරම්භ කරන ලදුව දැනට ශ්‍රී ලංකාවේ ගම්මාන 15000 ක විසිරී පැතිරී ඇති සර්වෝදය සාමය හා සංවර්ධනය සඳහා වූ ජාතික ව්‍යාපාරයකි . ශ්‍රී ලංකාවේ අන්ත දිළිඳු ජනතාවගේ තත්වය උසස් කිරීම පිණිස සම්පත් බෙදා ගැනීමේ පදනම මත අධික දරිද්‍රතාවයෙන් මෙන්ම අධික ඉසුරුමත් බවින්ද තොර සමාජ සංස්ථාවක් බිහිකිරීමත් , සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ,මානව හිමිකම් හා පරිසර චිරස්ථායි බවත් ප්‍රගමනය කිරීමත් එහි අභිලාෂය වෙයි. සර්වෝදය රාජ්‍ය නොවන පුණ්‍යායතන තත්වයේ සංවර්ධන ආයතනයකි.

<u>කාර්‍ය විෂය පථය</u>

සර්වෝදයේ වැඩ කටයුතු තුලින් සමාජීය හා තාක්ෂණික ශක්තිකරණය ස්ථාපිත කිරීමට අදහස් කෙරේ.සාමය හා චිරස්ථායි ජාතික සුබසිද්ධිය ප්‍රගමනය කිරීමට සමගාමීව සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සාරධර්ම හා සංස්කෘතිය ගම් මට්ටමේ සිට සංරක්ෂණය කිරීමට එම කාර්‍යයන් සැලසුම් කර ඇත.

<u>5R සුනාමි වැඩ සටහන - යලි උදාකිරීම සඳහා සහන</u>

දිවයින පුරා දිස්ත්‍රික් 13 ක ගම්මාන 226 ක සහන, පුනරුත්ථාපන , ප්‍රතිසංස්කරණ , සමටකරණ හා යලි උදාකිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වු වැඩ සටහන් කන්දරාවක් ක්‍රියාත්මක කිරීමේ වගකීම සර්වෝදය විසින් භාර ගෙන ඇත.

<u>අන්තර්ජාතික පිලිගැනීම</u>

සර්වෝදය සේවාවන් , විශේෂයෙන් ම සුනාමි ව්‍යසනය සිදුවූ මොහොතේ සිට කරනු ලැබූ හා දැනටද කරගෙන යනු ලබන ප්‍රයත්නයන් අගය කිරීමක් වශයෙන් එක්සත් ජාතීන් විසින් ප්‍රදානය කරන ලද 2005 ජනාවාස පිලිබඳ ගෞරව සම්මානය , සර්වෝදය වෙත මෑත භාගයේදී ප්‍රදානය කරනු ලැබ ඇති අන්තර්ජාතික සම්මාන අතරින් අළුත්ම සම්මානය වේ.

<u>ස්වයං මූල්‍ය ස්ථාවරත්වය පතා කටයුතු මෙහෙයවීම</u>

සර්වෝදය ව්‍යාපාරයේ සාරධර්ම , සංස්කෘතිය හා දර්ශනය ආරක්ෂා කර ගන්නා අතරම, බිම් මට්ටමේ දී මෙන්ම ජාතික බිම් මට්ටමේදීද සිය මූල්‍ය ස්වාධීනත්වය හා ස්වයං චිරස්ථායිභාවය ප්‍රවර්ධනය කර ගැනීමේ අවශ්‍යතාවය පිලිබඳව සර්වෝදය පෙරටත් වඩා අද සංවේදීව සිටී. මේ පරමාර්ථයෙන් , නව මූලාරම්භයක් දැනට ස්ථාපනය කරනු ලැබ ඇත.නව ප්‍රජා සංචාරක මූලාරම්භයේ අරමුණ , අපගේ ස්වාභාවික සම්පත් තුලින් හා ග්‍රාමීය සංස්කෘතිය හා දර්ශණය තුලින්ද අර්ථවත් හා අවබෝධාත්මක අත්දැකීම් ලබාගැනීමට අපේක්ෂා කරමින් නේවාසිකවන දේශීය හා විදේශීය සංචාරකයින් හවුල් කරගෙන සර්වෝදයේ හා එහි ග්‍රාමීය ප්‍රජාවන්හි ආදායම හා සංස්කෘතික සාරධර්ම තිරසාර ලෙස වර්ධනය කිරීමයි. ගම්බද නිවාසවල හා අන්තර් ක්‍රියාකාරී ප්‍රජා මධ්‍යස්ථානවල සාමාන්‍ය තාවකාලික නවාතැන් ගැනීම්වල සිට පරිසර අධ්‍යයන ලැගුම්හල් දක්වා අත්දැකීම් පරාසය පුළුල් වනු ඇත. මෙම උත්සාහය මල්ඵල ගැන්වීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවීන ඉංග්‍රීසි ජාතික කාන්තාවක් ඇයගේ කාලය හා විශේෂඥතාවය ස්වෙච්චාවෙන් ලබා දීමට දැනට ඉදිරිපත් වී සිටින්නීය. මේ පිලිබඳව ඔබගේ

උනන්දුව හෝ අනුග්‍රහයක් සටහන් කර ගැනීම සඳහා කැතරින් ලීච් වෙත ඊ - මේල් කරන්න.(catherineleech@ mac.com)

සර්වෝදයේ මිත්‍රවරුණි - දැන් ලියාපදිංචි වන්න

ලෝක ව්‍යාප්ත ආධාරක ජාලයක් පිහිටුවීම , තොරතුරු බෙදා හැරීම , පරිත්‍යාග පටිපාටි , ස්වෙච්චා වෘත්තිය ආධාර සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කිරීම පිණිස යාන්ත්‍රණයක් පිහිටුවීමේ ක්‍රියාවලියෙහි දැන් සර්වෝදය නිරතව සිටී. “ සර්වෝදයේ සහෘදයෝ’ වැඩ පිලිවෙල 2006 වසර මුලදී දියත් කර ඇත. ඔබ උනන්දුවෙන් දක්වන්නේ නම් කරුණාකර ඊ - මේල් මගින් friends@sarvodaya.lk අමතා ලියාපදිංචි වන්න. වැඩ සටහන දියත් කරන අවස්ථාවේදී සර්වෝදය විසින් ඔබ අමතනු ඇත.